**තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන - 2019**

**-----------------------------------------------------------**

තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල අතර 2017 ඔක්තෝම්බර් 20 දිනැති උපදේශක එකගතාවයෙහි (Aide Memoire) වෙත 10 වැනි කොටස සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ පවතින ද්විතීයික අධ්‍යාපන ක්‍රමයේ ධාරිතාව ශක්තිමත් කිරීම වැඩසටහනේ පරමාර්ථය වේ. සිවිල් වැඩ, උපකරණ, ගෘහභාණ්ඩ, ධාරිතා සංවර්ධනය ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,287.1කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 60.70ක් වූ අතර ඉන් රු.මිලියන 7,650කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 50ක් මූල්‍යනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ඉතිරි මුදල වන රු. මිලියන 1,637.1 ක් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ආරම්භ කරන ලද අතර 2022 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 මාර්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන මඟින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන පරිදි විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහනේ උපදේශක එකගතාවයෙහි (Aide Memoire) අධීක්ෂණ සැලැස්මේ 10 ඡේදය. | වැඩසටහන වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළුව පිළියෙල කරනු ලබන ගිණුම් වාර්ෂිකව විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් 2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2023 ජූනි 06වන දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | පසුගිය වසරවල ණය මුදලින් කිසිදු වියදමක් සිදු නොකළ අතර දේශීය අරමුදලින් පමණක් වියදම් දරන ලදී. කෙසේ වෙතත් ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට මම වග බලා ගන්නෙමි. | මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/ 2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 09.3 ඡේදය සහ උපදේශක | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වන බවට රේඛීය අමාත්‍යාංශ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් සහතික විය | ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් මාසයේදී නිල වශයෙන් ආරම්භ කළ බැවින් මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා | චක්‍රලේඛයෙහි සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි උපදෙස් පිළිපැදීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| එකගතාවයෙහි (Aide Memoire) 12 ඡේදය අනුව | යුතුය. කෙසේ වෙතත් සලකා බලනු ලබන වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පවත්වා නොතිබුණි. | නොතිබුණි. |

### 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම් පිළිබද භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාකාරකම | 2019 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාද/ විගණන ගැටළුව | ප්‍රමාද වීමට හේතුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ඒකක/ ප්‍රතිශතය | ළගාකර ගත් කාර්යය සාධනය ඒකක/ ප්‍රතිශතය | | | | |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන්, ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ, යන්ත්‍ර, පිරියත සහ උපකරණ, වෙනත් | 100 | 0.12 | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අනුව විෂයයන් 8 ක් සඳහා රු. 3,630,000,000 ක මුදලක් වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.4,296,396 ක් හෙවත් සියයට 0.12 ක් පමණක් වැය කර තිබුණි. | ව්‍යාපෘතියේ සියලුම ඉදිකිරීම් කටයුතු නිල වශයෙන් 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද බැවින්. | ව්‍යාපෘතියේ සියලුම ඉදිකිරීම් කටයුතු නිල වශයෙන් 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කළ බැවින්, 2019 වර්ෂයේ එක් එක් අයවැය විෂයයට අදාළ වියදම් ඉතිරිවී ඇත. | ලබා දී ඇති කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගත යුතුය. |

### 3.2 නිෂ්ක්‍රීය සම්පත්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| උපදේශක එකගතාවයෙහි (Aide Memoire) බෙදාහැරීමේ සැලැස්මේ ඡේද 09ට අනුව, 2019 වර්ෂයේදී ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් (OFID) අරමුදල්වලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 4.97 ක ණය අරමුදල් ලබා ගැනීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2019 දී වැඩසටහන මඟින් කිසිදු ණයක් ලබා දීම සිදු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 2018 ආරම්භ කළද 2018, 2019 සහ 2020 වසරවල විදේශ අරමුදල් යටතේ කිසිදු වියදමක් සිදු නොකළ අතර නව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයක් පත් කර 2021 අප්‍රේල් මාසයේ සිට නැවත ආරම්භ කරන ලදී. එබැවින් 2019 වර්ෂයට අදාළ ණය මුදල ප්‍රයෝජනයට ගෙන නොමැත. | ණය අරමුදල් නියමිත කාලසීමාවන් තුළ ලබා දී භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |